Path to Success - Study Pack

තෙවන පාසල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල

බුද්ධ ධර්මය - 8 ශ්‍රේණිය

අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැළණිය

උපදේශනය හා අධීක්ෂණය

පී.ඩී.ඉරෝෂණි කේ. පරණගම මිය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ)

මෙහෙයවීම හා සංවිධානය

එෆ්.එච්.ජේ.පී.සිල්වා මයා

(නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන)

විෂය සම්බන්ධීකරණය

පූජ්‍ය දඹෝරේ පියරතන හිමි

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගම)

සැකසුම

කේ.පී.අනුෂා කුමාරි මිය

බප/කැළ/මහාමායා බාලිකා විද්‍යාලය, කඩවත

-සියලුම හිමිකම් ඇවිරිණි-

8 ශ්‍රේණිය

17 වන පාඩම

<u>බුදු සිරිත හා බැඳුණු තුරුලතා රැක ගනිමු.</u>

පරිසරය යනු අප අවට ඇති වටපිටාවයි. තුරුලතා යනු පරිසරයේ ඇති වටිනා සම්පතකි. එමගින් අපට ලැබෙන ප්‍රයෝජන මිල කල නොහැකි තරම්ය.

බුදුන් වහන්සේ ද ස්වභාවික පරිසරයේ තුරුලතා වලට බෙහෙවින් ආදරය කල කෘතගුණ සැලකූ ශාස්තෘවරයාණන් වහන්සේ කෙනෙකි. උන්වහන්සේගේ ජීවිතය තුරුලතා සපිරි පරිසරය සමඟ පැවැත් වූ සබඳතා අපමණය. ඉන් කීපයක් පහත දැක්වේ.

01. සම්බුද්ධ තෙමඟුල ස්වභාවික පරිසරය ආශ්‍රිතව සිදුවීම.

උදා :- **ඉපදීම**

සොඳුරු තුරුලතාවන්ගෙන් ගහණ වූ ලුම්බිණි සල් උයනේ සල් ගසක් යට සිදුවීම.

බුදුවීම

උරුවෙල් ජනපදයේ සේනානි ගමේ ස්වභාවික පරිසරය තුල පිහිටි ඇසතු වෘක්ෂ මූලය ඇසුරේදි සිදුවීම.

පරිනිර්වාණය

මහා පරිනිර්වාණ සූත්‍රයට අනුව කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවර්තන සල් උයනේ සල් ගස් දෙකක් අතර පනවා තිබූ යහනකදි සිදුවීම.

02. පන්සාලිස් වසක් පමණ වූ බුදුරදුන්ගේ ජීවිතය නිරතුරුවම සොබා දහම ඇසුරේ ගතවීම. උදා :- සුන්දර වනය , සොඳුරු ගංගා තීර , පර්වත , කෙත්යාය වැනි ස්ථාන වල විවේකය ගත කිරීම.

03. බුදුරජාණන් වහන්සේ බොහෝ ධර්ම දේශනා ස්වභාවික පරිසරය ආශ්‍රිතව පැවැත්වීම.

උදා :- දම්සක් පැවතුම් සූත්‍රය - බරණැස ඉසිපතන මිගදායේ දී

අම්බට්ඨ සූත්‍රය - ඉච්ඡානංගල බමුණු ගමේ සුන්දර වන ලැහැබකදී

කේවට්ඨ සූත්‍රය - අචිරවති නදි තෙර අසල අඹ වනයක දී

මහා සිහනාද සූත්‍රය - විශාලා නුවර වන පියසකදී

මහා මොග්ගල්ලාන සූත්‍රය - කලන්දක නිවාප නම් වනයේ දී

04. එක්තරා දේවතාවෙක් මහ වනය පිළිබඳව කල ප්‍රකාශයකට බුදුන්වහන්සේ මෙසේ පිළිතුරු ලබා දී ඇත.

දේවතාවා - සිටි මද්දහනෙහි පක්ෂිහු ඉසුබුලති . වනය මහත් සේ හඬ නගන්නාක් මෙනි. එය මට බියක්ව වැටහෙයි.

බුදුන් වහන්සේ - සිටි මද්දහනෙහි පක්ෂිහු ඉසුබුලති . වනය මහත් සේ හඬ නගන්නාක් මෙනි. එය මට සිත් පිනවන්නක්ව වැටහේ.

05. එක්තරා දේවතාවෙක් දිවා රෑ පින් වැඩෙන ආකාරය ඇසූ විට බුදුන් වහන්සේ මෙසේ පිළිතුරු ලබා දී ඇත.

යමෙක් මල් පලතුරු උයන්වතු වවන්නේද , වන වගා කරන්නේ ද , ඒ දඬු පාලම් , පැන්හල් පොකුණු ආවාස තනා දෙයිද ඔවුනට දිවා රෑ පින් වැඩේ.

06. බුදුදහම මඟින් පරිසරය රැක ගැනීමට අවශ්‍ය කාරණාද උගන්වා ඇත. පාචිත්තිය පාලියට අනුව ,

තණ නිල්ල අපිරිසිදු කිරීම, තණ කොල මත මලමුත්‍රා, කුණුරොඩු දැමීම, ඉඳුල් දැමීම නොකල යුතුය.

07. බුදුරජාණන් වහන්සේ වස් විසීමට උපදෙස් ලබාදීම සිදු කළේද වැහි කාලයේදී පවා දලුලා වැඩෙන තණකොළ වැනි ශාඛ ආරක්ෂා කර ගැනීමේ අදහසිනි.

තුරුලතාවන්ගෙන් අපට සැලසෙන සේවය ඉමහත්ය. එනිසා එම සම්පත අප රැක ගත යුතුය. එසේ කෘතවේදී විය යුතුය. බුදුන්වහන්සේ අනිමිස ලෝචන පූජාවෙන් තමාට බුදු වීමට සෙවණ ලබාදුන් ඇසතු බෝ ගසට කළගුණ සැලකූහ.

ක්‍රියාකාරකම්

1. සම්බුද්ධ තෙමඟුල හා තුරුලතාවන්ගෙන් සපිරි ස්වභාවික පරිසරය අතර පැවති සම්බන්ධය පැහැදිලි කරන්න.
2. බුදුරදුන් තුරුලතා ඇසුරෙහි වැඩ සිටිමින් සිදුකල ධර්ම දේශනා පහක් නම් කරන්න.
3. බුදු දහමට අනුව දිවා රෑ පින් සැලසෙන කටයුතු මොනවා ද?
4. ගසකින් අපට ලැබෙන සේවය බුදු දහම අනුව පැහැදිලි කරන්න.
5. තුරුලතා සංරක්ෂණයට පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට කල හැකි මෙහෙවර පැහැදිලි කරන්න.

18 වන පාඩම (8 ශ්‍රේණිය)

සසුන් කෙත රැක්මට බැඳුණු රන්වැට

බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව පළමු ධර්ම සංගායනාව පැවැත්විය. එයට ප්‍රධානතම හේතුව වූයේ සුභද්‍ර නම් භික්ෂුවගේ නොමනා ප්‍රකාශයයි. බුදුන්වහන්සේගේ පරිනිර්වාණය අසා හඬා වැළපුන මාර්ග ඵල නොලැබූ භික්ෂූන් අමතා සුභද්‍ර හිමි,

"ඇවැත්නි ශෝක නොවන්න. නොවැළපෙන්න. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුනෙමු. මෙය කැපය, මෙය අකැපය , යැයි නීති පැනවීමට කෙනෙක් නැත. දැන් අපිට කැමති දෙයක් කල හැකිය. අකමැති දෙයක් නොකල හැකිය."

යනුවෙන් කළ ප්‍රකාශය සංගායනාවට බලපෑ ප්‍රධාන හේතුව විය.

පැවැත් වූ ස්ථානය	-	රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයෙහි සප්ත පර්ණී ලෙන අබියස සකස් කල මණ්ඩපයක දී,
මූලිකත්වය	-	මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ
අනුග්‍රාහකත්වය	-	අජාසත්ත රජතුමා
සහභාගීත්වය	-	මහරහතන් වහන්සේලා පන්සියයයි.
හැඳින් වූ වෙනත් නම්	-	පඤ්චසතික සංගීතිය , ථේරිකා සංගීතිය

සංගායනාවේ ප්‍රතිඵල :-

1. බුදුන් වහන්සේ දේශනා කල ධර්මය හා විනය එක් රැස්කර ගැනීමට හැකිවීම.
2. ධර්මය විනය ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා එය කොටස් වලට බෙදා භාණක පරම්පරා වලට පැවරීම.

   උදා:- විනය කොටස් පහකට බෙදා එය කට පාඩමින් ඉදිරියට ගෙන ඒම සඳහා උපාලි මහරහතන් වහන්සේ ඇතුලු ශිෂ්‍ය පරම්පරාවට පැවරීම.

i. පාරාජික පාලි iii. චුල්ල වග්ග පාලි v. පරිවාර පාලි
ii. පාචිත්තිය පාලි iv. මහා වග්ග පාලි

උදා :- ධර්මය නිකාය වශයෙන් කොටස් පහකට බෙදා කට පාඩමින් ඉදිරියට පවත්වා ගෙන ඒමට සැලසීම.

i.	දීඝ නිකාය	-	ආනන්ද තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාව
ii.	මජ්ඣිම නිකාය	-	සැරියුත් තෙරණුවන්ගේ ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාව
iii.	සංයුක්ත නිකාය	-	මහා කාශ්‍යප තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාව
iv.	අංගුත්තර නිකාය	-	අනුරුද්ධ තෙරණුවන් ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාව
v.	ඛුද්දක නිකාය	-	සියලුම භික්ෂූන් වහන්සේලා

3. ශාසනයේ නායකත්වය සඳහා ධර්මය සහ විනය යොදා ගැනීමට තීරණය කිරීම.

4. කුඩා අනුකුඩා ශික්ෂා පද (බුද්දානුබුද්දක ශික්ෂා පද) වෙනස් නොකිරීමට තීරණය කිරීම.

5. ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනා වලින් උන්වහන්සේ නිදහස් වීම.

6. සසුනට සිදුවිය හැකිව තිබූ හානි වළක්වා ගැනීමට හැකිවීම.

මෙම ප්‍රතිඵලයන් නිසා සසුන් කෙත දීර්ඝ කාලයක් පුරාවට ආරක්ෂාකාරී විය. බුදු සසුනට එල්ල වූ චෝදනා සහ උද්ගත වීමට තිබූ ගැටළු සංගායනාව නිසා අවම විය. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග වත්මන් සමාජ ගැටළු විසඳා ගැනිමට ද ආදර්ශ කොට ගත හැකිය.

උදා :-

- සාකච්ඡාවෙන් සාමූහිකව තීරණ වලට එළඹීමට හැකිවීම.
- සාමූහික කටයුත්තකදී ඒ සඳහා මූලිකත්වයට සුදුසු අයකු පත්කර ගැනීම.
- ගැටලු විසඳීමේ දී බුද්ධිමතුන්ගේ හා විශේෂඥයින්ගේ දැනුම ලබා ගැනීම.
- යම් යම් ගැටලු මතුවට ඇතිවීම වළක්වාලීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් ඉදිරිපත් කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හි දී රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීමට යොමු වීම.
- සැලසුම් සහගතව කිසියම් ක්‍රියාකාරකමක් සිදු කිරීම තුළින් යහපත් ප්‍රතිඵල උදාකර ගැනීමේ හැකියාව ලැබීම.

ක්‍රියාකාරකම

01. සුභද්‍ර භික්ෂුවගේ නොමනා ප්‍රකාශය ගෙන හැර දක්වන්න.

02. ප්‍රථම සංගායනාවට අදාළ මූලික කරුණු ඇතුළත් කර කෙටි සටහනක් ලියන්න.

03. සූත්‍ර පිටකයට අයත් දේශනා ආරක්ෂා කර පවත්වාගෙන යාමට අදාළ භාණක පිරිස් නම් කරන්න.

04. විනයට අදාළ ඉගැන්වීම් වලට අයත් වන කොටස් පහ නම් කරන්න.

05. ප්‍රථම ධර්ම සංගායනාවේ දී අනුගමනය කල ක්‍රියා මාර්ග වර්තමානයේ ඇති වන බොහෝ ගැටලු විසඳා ගැනිමට උපකාරී කරගත හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

19 වන පාඩම

<u>සිරි දළදා අසිරිය</u>

හේමමාලා කුමරිය සහ දන්ත කුමරු විසින් කිතිසිරිමෙවන් රජ දවසදි ශ්‍රී ලංකාවට දළදා වහන්සේ වැඩම කරවාගෙන පැමිණි බව සඳහන් වේ. මෙය බුදුන් වහන්සේගේ යටි හණුවෙහි වම් දළදාව බව පාලි ලලාඨ ධාතු වංශයෙහි සඳහන් වේ. දැනට දළදා වහන්සේ වැඩ සිටින්නේ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේය. දළදා වහන්සේ පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ රාශියක් පවතී.

උදා:- පාලි දාඨාවංසය , දළදා සිරිත , දළදා පූජාවලිය , දළදා වරුණ යනාදියයි.

සියලුම දළදා පුද පූජා පැවැත්වෙන කාලය අනුව කොටස් තුනකි.

1. දෛනික පුද පූජා හෙවත් දිනපතා පවත්වන පුද පූජා
2. සප්තාහික පුද පුජා හෙවත් සතියකට වරක් කරන පුද පූජා
3. වාර්ෂික පුද පූජා

<u>01. දෛනික පුද පූජා</u>

දළදා වහන්සේ උදෙසා දිනකට තුන්වරක් පුද පූජා පැවැත්වේ.

(1) අලුයම පූජාව (2) නව පෑ පූජාව (3) හැන්දෑ පූජාව යනුවෙනි.

අලුයම පූජාව - අලුයම 5.15 ට පමණ හේවිසි වාදනය කර 5.30 ට පමණ තේවාව ආරම්භ කරයි.

තේවාකාර ධූර කීපයකි.

1.	වට්ටෝරු රාල	2.	ගෙපරාල	3.	කත්තියන රාල
4.	හක්ගෙඩි රාල	5.	පල්ලේමාලේ රාල	6.	දොරකඩ ආරච්චි

නව පෑ පූජාව - මෙය ආරම්භ වන්නේ පෙ.ව. 10.00 ටය.
හැන්දෑ පූජාව - මෙය ආරම්භ වන්නේ ප.ව. 6.15 ට පමණය.

<u>02. සප්තාහික පූජාව</u>

සෑම සතියකම බදාදා දින මෙම පූජාව සිදු කරයි. දළදා වහන්සේ උදෙසා නානුමුර මංගල්‍යය (දළදා වහන්සේ ස්නානය කිරීම) පවත්වයි.

<u>03. වාර්ෂික පුද පූජා</u>

දළදා වහන්සේ මුල්කරගෙන සතර මහා මංගල්‍යය නමින් හැඳින්වෙන ප්‍රධන පූජාවන් වාර්ෂිකව සිදු කරයි. ඒවානම්,

1.	අලුත් සහල් මංගල්‍යය	2.	අලුත් අවුරුදු මංගල්‍යය
3.	ඇසළ මංගල්‍යය	4.	කාර්තික මංගල්‍යය

මෙහිදි වැදගත්ම අංගය වන්නේ ඇසළ මංගල්‍යයයි. කප් සිටුවීමෙන් ඇරඹෙන ඇසළ මහා පෙරහැර දේවාල , දේවාල පෙරහැර , කුඹල් පෙරහැර හා රන්දෝලි පෙරහැර පැවැත්වීමෙන් පසු දිය කැපීමෙන් නිමාවට පත්වේ. ඇසළ මහා පෙරහැර ගමන් කරන පිළිවෙල අනුව ප්‍රධාන කොටස් පහකින් යුක්තය.

1.	දළදා මාළිගාවේ පෙරහර	2.	නාථ දේවාලයේ පෙරහර
3.	විෂ්ණු දේවාලයේ පෙරහර	4.	කතරගම දේවාලයේ පෙරහර
5.	පත්තිනි දේවාලයේ පෙරහර,		යනුවෙනි.

ක්‍රියාකාරකම

1. දළදා වහන්සේ පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ නම් කරන්න.

2. සතර මහා මංගල්‍යය පූජාවන් හඳුන්වා දෙන්න.

3. දළදා පෙරහරේ ඔබ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

20 වන පාඩම

සැපවත් ජීවිතයකට මඟ

බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමාට අනණ සූත්‍රයේ දී ගිහියෙකු විසින් ලඟා කරගත යුතු සැප හතරක් විස්තර කර ඇත. එමඟින් ගිහියෙකු විසින් ධනය උපයා ගත යුතු අකාරය සහ පරිභෝජනය කළයුතු ආකාරය ගැන වැදගත් කරුණු ගණනාවක් කියැවේ. එම සැප හතර වන්නේ,

1. අත්ථි සුඛ
2. භෝග සුඛ
3. අණන සුඛ
4. අනවජ්ජ සුඛ

01. අත්ථි සුඛ - යමෙකු උත්සාහයෙන් , දෑතේ මහන්සියෙන් , ඩහදිය වගුරවා ධාර්මිකව උපයා ගත් ධනයක් තමාට ඇතැයි සිතා සතුටු වීමයි.

- **ධාර්මිකව ධනය උපයා ගත යුතු රැකියා :-**
  1. කෘෂිකර්මාන්තය
  2. ධාර්මික වෙළඳාම
  3. ගව පාලනය
  4. රාජ්‍ය සේවය
  5. අනෙකුත් ශිල්ප / කර්මාන්ත
- **ධනය උපයා නොගත යුතු අධාර්මික රැකියා :-**
  1. අවි ආයුධ වෙළඳාම
  2. සත්ව වෙළඳාම
  3. මස් වෙළඳාම
  4. මත්ද්‍රව්‍ය වෙළඳාම
  5. වස වෙළඳාම
- **දැහැමි වෙළඳාමේදී නොකළ යුතු වංචනික ක්‍රියා :-**

  හොරට කිරීම , හොරට මැනීම නොකළ යුතුය.

  උදා :- තුලා කූට , මාන කූට , කංස කූට

02. භෝග සුඛ - ඉහත දක්වා ඇති ආකාරයට ධාර්මිකව උපයාගත් ධනය භුක්ති විඳිමින් පින් දහම් කිරීමට ද සිතිම භෝග සුඛයයි.

භෝග සුඛය විඳිමේ දී තමා පමණක් භුක්ති විඳිම නොව දෙමාපියන් , අඹුදරුවන් , සේවක සේවිකාවන් , මිතුරන් , ශ්‍රමණ බ්‍රාහ්මණ ආදී සමාජ කොටස් සැපවත් කිරීමට ද එම ධනය යෙදවිය යුතුය. භෝග සුඛය විඳිමේ දී යමෙකු "උදුම්බර බාදික" එනම් අනවශ්‍ය ලෙස පරිහරණය කිරීමද නොකල යුතුය. "අජ්ඣු මාරික" නොවිය යුතුය. එනම් නොකා නොබී මරණයට පත්වීම නොවිය යුතුය.

03. අනණ සුඛය - යමෙකු තමා කිසිවෙකුට ණය නැතැයි සිතා සතුටු වීම අනණ සැපයයි. ආදායමට ගැලපෙන සේ වියදම කළමණාකරනය කර ගැනිමට බුදු දහම උපදෙස් ලබාදෙයි. ආදායම හා වියදම සමසේ පවත්වා ගැනීම සමජීවිකතා යනුවෙන් හඳුන්වයි.

04. අනවජ්ජ සුඛ :- යමෙකු තමා නිවැරදි වූ කාය කර්මයෙන්ද නිවැරදි වූ වාග් කර්මයෙන්ද , නිවැරදි වූ මනෝ කර්මයෙන්ද යුක්ත. වෙමි යැයි සිතා සතුටු වීමයි. යහපත්ව සිතා යහපත්ව කටයුතු කර යහපත්ව ජීවත් වීම මින් කියැවේ.

ක්‍රියාකාරකම

01. ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතර හඳුන්වාදෙන්න.

02. බුදු දහමින් නිර්දේශිත රැකියා හතරක් නම් කරන්න.

03. බුදුදහමට අනුව අදැහැමි රැකියා හඳුන්වා දෙන්න.

04. රැකියාවක් තෝරා ගැනීමේ දී ඔබ සැලකිලිමත් වන කරුණු මොනවා දැයි ලියා දක්වන්න.

21 වන පාඩම

පිරිහීම මඟ හරින අපරිහානිය ධර්ම

බුදුරදුන් වජ්ජි ජනපදයේ සාරන්දද චෛත්‍යය නම් ස්ථානයේ දී ලිච්ඡවින්ට (වජ්ජි රජ දරුවන්ට) සප්ත අපරිහානිය ධර්ම දේශනා කර ඇත. මෙම අපරිහානිය ධර්ම පිළිපදින තාක්කල් පුද්ගලයෙකුගේ හෝ ඕනෑම ස්ථානයක පිරිහීමක් ඇති නොවන බව සඳහන් වේ. එම සප්ත අපරිහානිය ධර්ම නම්,

01. නිතර නිතර රැස්වීම

02. සමඟිව රැස්ව සමඟිව සාකච්ඡා කර සමඟිව විසිර යාම

03. නොපැන වූ නීති නොපැන වීම හා පැන වූ නීති ආරක්ෂා කිරීම.

04. වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපදිමින් ඔවුන්ට ගරු කිරීම.

05. කුල කාන්තාවන් ආරක්ෂා කිරීම.

06. වජ්ජි රාජ්‍යය ඇතුළත හා පිටත පිහිටි පූජනීය ස්ථාන වලට ගරු කිරීම හා ඒවා නඩත්තු කිරීම.

07. තම රාජ්‍යයට නොපැමිණි පූජ්‍ය පක්ෂය ගෙන්වා ගැනීම සහ පැමිණ සිටින පූජ්‍ය පක්ෂයට දැහැමි රැකවරණය සලසා දීම.

විශේෂයෙන් රාජ්‍ය පාලකයන් මේවා අනුගමනය කිරීමෙන් රටක සංවර්ධනය කරා ළඟා වීම සිදුවේ. එබැවින් කාලීන වටිනාකමකින් යුත් මෙම අපරිහානිය ධර්ම රාජ්‍යයක මනා පැවැත්මට මෙන්ම කුඩාම සංවිධානයක පැවැත්මට ද උපකාරී වේ.

ක්‍රියාකාරකම

01. බුදුන්වහන්සේ සප්ත අපරිහානිය ධර්ම දේශනා කලේ කුමන ස්ථානයකදී කවුරුන් හටද?

02. නීතිගරුකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ හඳුන්වා දෙන්න.

03. සප්ත අපරිහානිය ධර්ම වල පවත්නා කාලීන වැදගත්කම පෙන්වා දෙමින් පුවත්පතකට ලිපියක් ලියන්න.

22 වන පාඩම

<u>මහා මංගල සූත්‍රය</u>

මංගල වන වචනයේ අර්ථය වන්නේ සුභ හෙවත් යහපත් දේ යන්නයි. එදා දඹදිව වැසියන් මංගල කරුණු ලෙස විවිධ දේ හඳුන්වා දුන්හ.

උදා:-

දිට්ඨ මංගලිකයන් - ඇසට දකින්නට ලැබෙන සුභ දේ මංගල කරුණු ලෙස හැඳින් වූ අය

සුත මංගලිකයන් - කනට ඇසෙන දේ මංගල කරුණු ලෙස හැඳින් වූ අය.

මුත මංගලිකයන් - දිවෙන් රස විඳින , කයෙන් ස්පර්ශ කරන , නාසයෙන් ආඝ්‍රාණය කරන සුභ දේවල් මංගල කරුණු ලෙස හැඳින් වූ අය.

එක්තරා දෙවියෙක් බුදුන් වහන්සේගෙන් මංගල කරුණු මොනවාදැයි විමසූ විට බුදුන්වහන්සේ ඊට පිළිතුරු දෙමින් මහා මංගල සූත්‍රය දේශනා කළ සේක. මහා මංගල සූත්‍රය තුල දැක්වෙන මංගල කාරණා තිස්අට මිනිසෙකුගේ ජීවිතයේ ළමා කාලයට , තරුණ කාලයට සහ සැදෑ සමයට ඉතා ප්‍රයෝජනවත් වේ.

ඒවා නම්,

01. බාලයන් ඇසුරු නොකිරීම.
02. පණ්ඩිතයන් ඇසුරු කිරීම.
03. පිදිය යුත්තන් පිදිම.
04. සුදුසු ප්‍රදේශයක වාසය කිරීම.
05. පෙර කරන ලද පින් ඇති බව.
06. සිතා මනා කොට පිහිටුවා ගැනීම.
07. බොහෝ ඇසුපිරු තැන් ඇති බව.
08. ශිල්ප දැනිම.
09. විනයෙහි මැනවින් හික්මීම.
10. යහපත් වචන කතා කිරීම.

ළමා කාලයට වැදගත්ය.

11. දෙමාපියන්ට උපස්ථාන කිරීම.
12. භාර්යාවට සංග්‍රහ කිරීම.
13. දරුවන්ට සංග්‍රහ කිරීම.
14. නිරවුල් කර්මාන්ත කිරීම.
15. දන්දීම.
16. ධර්මයට අනුව හැසිරීම.
17. නෑදෑයන්ට සංග්‍රහ කිරීම.
18. නිවැරදි ක්‍රියාවල යෙදිම.
19. පවට අකමැති විම හා පවින් වෙන්වීම.
20. මත් පැන් භාවිතයෙන් වැළකීම.

තරුණ කාලයට විශේෂයෙන්ම වැදගත්ය.

21. කුසල් දහම්හි පමා නොවීම.
22. ගරුකල යුත්තන්ට ගරු කිරීම.
23. යටහත් ගති පැවතුම් ඇති බව.
24. ලද දෙයින් සතුටු වීම.
25. කළගුණ සැලකීම.
26. සුදුසු කල්හි ධර්ම ශ්‍රවණය.
27. ඉවසීම
28. කීකරු කම.
29. පැවිදි උතුමන් දැකීම.
30. සුදුසු කල්හි ධර්ම සාකච්ඡා පැවැත්වීම

31. කෙලෙස් තැවීම
32. බඹසරෙහි හැසිරීම.
33. ආර්ය සත්‍ය වටහා ගැනීම.
34. නිවන් අවබෝධ කිරීම.
35. අටලෝ දහමින් කම්පා නොවීම.
36. සිත්හි ශෝක නැති බව.
37. කෙලෙස් නැති බව.
38. බිය නැති බව.

සැදෑ සමයට විශේෂයෙන්ම වැදගත්ය.

වයස් භේදයකින් තොරව මෙම කරුණු පිළිපැදිමෙන් අප සියලු දෙනාටම දෙලොව දියුණුව සලසා ගත හැකිය.

<u>ක්‍රියාකාරකම</u>

01. එදා දඹදිව වැසියන් මංගල කරුණු ලෙස හැඳින් වූයේ මොනවා ද?
02. ළමා කාලයට වැදගත් වන මංගල කරුණු පිළිබඳ විස්තරයක් ලියන්න.
03. බහු දේවා මනුස්සාව යනාදි වශයෙන් මංගල කරුණු දැක්වෙන ගාථාව ලියා දක්වන්න.
04. දෙමව්පියන් සමඟ දිනපතා බුදුන් වැඳ අවසානයේ සතියකට දින දෙකක්වත් මහා මංගල සූත්‍රය සජ්ඣායනා කරන්න.